# අන්තර්පාරිවේණික භාෂා හා සාහිත්‍ය තරගය
## උපදෙස් පත්‍රිකාව

## ගද්‍ය රචනා තරගය

1. සිංහල, පාලි, සංස්කෘත, ඉංග්‍රීසි හා දෙමළ යන භාෂා පහෙන් ම මෙම තරගය පැවැත්වේ. සිංහල, පාලි, සංස්කෘත හා ඉංග්‍රීසි ගද්‍ය රචනා තරග අංශ හතර සඳහා ම පැවැත්වෙන අතර දෙමළ ගද්‍ය රචනා තරගය පූර්ව ප්‍රාථමික අංශය හැර සෙසු අංශ සඳහා පැවැත්වේ. එක් තරගකරුවෙකුට එක් භාෂා මාධ්‍යයකින් පමණක් තරගයට සහභාගී විය හැකි ය.

1.1. අභිමතාර්ථ

1. මාතෘකාවට අදාළව ව්‍යාකරණානුකූල ලෙස සංගත බවෙන් යුක්තව අදහස් පෙළගැස්වීමේ හැකියාව වර්ධනය කිරීම.
2. ලේඛන කුසලතාව වර්ධනය කිරීම සහ විවිධ රචනා ශෛලීන් හැඳිනගෙන ඒවා භාවිතයෙහි යෙදවීම හා පෙළඹවීම.

1.2. තරග කොන්දේසි

1. පූර්ව ප්‍රාථමික හා ප්‍රාථමික තරගකරුවන් දෙනු ලබන මාතෘකාවකට අනුව වචන 150ක නොඅඩු වාක්‍ය රචනාවක් ද, කනිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ අංශයේ තරගකරුවන් වචන 250කට නොඅඩු වාක්‍ය රචනාවක් ද කළ යුතු ය.
2. අදාළ භාෂාවෙන් ම රචනය ලිවිය යුතු අතර සංස්කෘත තරගකරුවන් නාගරී අකුරු භාවිතා කළ යුතු ය. දෙමළ තරගකරුවන් දෙමළ අකුරු භාවිතා කළ යුතු ය.
3. සියලූ ම තරගකරුවන් සඳහා ලැබෙන කාලය පැය 01 කි.
4. පැහැදිලි අත් අකුරු, අක්ෂර වින්‍යාසය, ඡේද වෙන් කර ලිවීම, මාතෘකාවට අදාළ බව කෙරෙහි සැලකිල්ලක් දැක්විය යුතු ය.
5. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.
6. ජාතික මට්ටම දක්වා ම පහත තේමා යටතේ මාතෘකා සැකසේ.

| | | | |
|---|---|---|---|
| I. | පිරිවෙන් අධ්‍යාපනය | | |
| II. | සිංහල, පාලි, සංස්කෘත සාහිත්‍යය | VIII. | ජාතික සමගිය |
| III. | දෙස බස රැසට සේවය කළ විරුවන් | IX. | ඉගෙනීම |
| IV. | ශ්‍රී ලංකාවේ ස්වභාව සෞන්දර්යය | X. | ජාතික උරුමයන් |
| V. | සිංහල, පාලි, සංස්කෘත පඬිවරු | XI. | ආගමික උත්සව |
| VI. | ජනමාධ්‍ය අංශය | XII. | ශාසනික පුනරුදය |
| VII. | ජාතික හා ආගමික උත්සව | XII. | පොතපත කියවීම |

1.3. ලකුණු ලබාදීමේ ක්‍රමය

| | | |
|---|---|---|
| 1. | සාරවත් කරුණු | 10 |
| 2. | භාෂා රීතීන් අනුගමනය | 10 |
| 3. | ශිල්පීය දක්ෂතා (පද බෙදීම/ඡේද වෙන් කිරීම/ විරාම ලක්ෂණ/ අත් අකුරු) | 10 |
| 4. | රචනා ශෛලිය | 10 |
| 5. | මාතෘකාවට අදාළ බව | 10 |
| | මුළු ලකුණු | 50 |